# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජූලි මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.07.09 දින නිකුත් කරන ලදී)**

# සමථ මණ්ඩල (සංශෝධන)

**1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
අමාත්‍යතුමාගේ නියමය පරිදි පල කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් කර ඇති යම් වරදක් සම්බන්ධයෙන් වන යම් ආරාවුලක පාර්ශ්වකරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක්, නිරවුල් නොකිරීමේ සහතිකය නොමැතිව, එම නිරවුල් නොකිරීම එම පාර්ශ්වකරු විසින් අධිකරණය ඉදිරියේ පිළිගනු ලබන්නේ නම් හෝ සමථකරණය තුළින් එම ආරාවුල විසඳා ගැනීම සඳහා වන තම අකමැත්ත ප්‍රකාශ කරනු ලබන්නේ නම්, යම් මුල් අවස්ථා අධිකරණයක් විසින් පිළිගනු ලැබීම සඳහා හැකියාව ලබාදීමය.

# සමථ මණ්ඩල (සංශෝධන)

එල්.ඩී.-ඕ. 67/2023

## 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2024 අංක      දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1988 අංක 72 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ "හෝ විධාන කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"හෝ විධාන කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඉකුත් වීමෙන් පසුව එම නිරවුල් නොකිරීමේ සහතිකය නිකුත් කර නොමැති අවස්ථාවක දී, එම වරදට අදාළ ආරාවුලේ පාර්ශ්වකරුවන් විසින් එම නිරවුල් නොකිරීම අධිකරණය ඉදිරියේ පිළිගනු ලැබුවහොත් හෝ සමථකරණය තුළින් එම ආරාවුල විසඳා ගැනීම සඳහා වන තම අකමැත්ත ප්‍රකාශ කරනු ලැබුවහොත්, මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩුවක් භාර ගැනීමෙන් මුල් අවස්ථා අධිකරණය වළක්වාලනු නොලැබිය යුතු ය.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.